# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපාය , බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1798/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 03/12/2024 පැය 1445

## මාධ්‍ය නිවේදනය

**<u>පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ</u>**

**01. 2024.12.02 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 02 | 02 | 30 | 180 | තඹ දඟර 01<br>යකඩ බැරල් 02<br>බුලි 01 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථානයන් වෙත ඉදිරිපත් කර ඇත.

**02. විදේශීය රටක නිෂ්පාදිත රිපීටර් වර්ගයේ ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා විශේෂ මෙහෙයුම් ඒකකය**

2024.12.02 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා විශේෂ මෙහෙයුම් ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් කොස්වත්ත පොලිස් වසමේ ලිහිරියාගම ප්‍රදේශයේ වැටලීමක් සිදුකර **විදේශීය රටක නිෂ්පාදිත රිපීටර් වර්ගයේ ගිනි අවියක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන කොස්වත්ත පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 58 ක් වන ලිහිරියාගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොස්වත්ත පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. බලපත්‍ර නොමැතිව මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා වාකරේ කඳවුර.**

2024.12.02 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා වාකරේ කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වාකරේ පොලිස් වසමේ කරුවක්කෝඩි ප්‍රදේශයේ වැටලීමක් සිදුකර **බලපත්‍ර නොමැතිව මෙරට නිශ්පාදිත ගිනි අවියක් සමඟ** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන වාකරේ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 41 ක් වූ වාකරේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

වාකරේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා මහනුවර කඳවුර.**

2024.12.02 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා මහනුවර කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් මහනුවර පොලිස් වසමේ මහනුවර ප්‍රදේශයේ වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 08 මිලිග්‍රෑම් 670 ක් සමඟ** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මහනුවර පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 65 ක් වන මහනුවර ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මහනුවර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**05. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කහවත්ත කඳවුර.**

2024.12.02 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා කහවත්ත කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් රක්වාන පොලිස් වසමේදී වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 03 මිලිග්‍රෑම් 10 ක් සමඟ** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන රක්වාන පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 19 ක් වන ගොඩකවෙල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

රක්වාන පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**06. අනවසරයෙන් රජයේ කැළෑ ප්‍රදේශයකට ඇතුළු වී එළි පෙහෙලි කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පුල්මුඩේ කඳවුර.**

2024.12.02 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා පුල්මුඩේ කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර පුල්මුඩේ පොලිස් වසමේ පාලම්කුලම් රජයේ කැළෑ ප්‍රදේශයට **අනවසරයෙන් ඇතුළු වී අක්කර භාගයක පමණ ප්‍රමාණයක් එළි පෙහෙලි කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන වැඩිදුර විමර්ශන සඳහා පුල්මුඩේ බීට්ටු වන නිලධාරී වෙත කාර්යාලය වෙත භාර දී ඇත.**

**අත්අඩංගුවට ගත් සැකකරු 35 ක් වූ පුල්මුඩේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

පුල්මුඩේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**